# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2179/9 – 2020 ජුනි මස 09 වැනි අඟහරුවාදා – 2020.06.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

**සුරාබදු ආඥාපනත (52 වන අධිකාරය වූ)**

අංක 04/2020 දරන සුරාබදු නිවේදනය

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමග කියවිය යුතු 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය මහින්ද රාජපක්ෂ වන මම, මෙම නිවේදනය මගින් 2020 අප්‍රේල් මස 30 දිනැති අංක 2173/11 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ අංක 02/2020 දරන සුරාබදු නිවේදනයේ පළමුවන උපලේඛනය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

පහත සඳහන් බදු 2020 ජුනි මස 09 වැනි දින සිට බලපැවැත්වේ.

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 ජුනි මස 09 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

1A – PG5015 – 592 (2020/06)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## I උපලේඛනය

| | I වන තීරුව<br>ද්‍රව්‍ය | II වන තීරුව<br>මසකට දේශීයව සපයනු ලබන/ ආනයනය කරනු ලබන ලීටර් ප්‍රමාණය | III වන තීරුව<br>බදු ප්‍රමාණය (තොග ලීටරයට රුපියල්) | |
|---|---|---|---|---|
| | | | දේශීයව සැපයුම | ආනයන |
| 1. | රජය විසින් අනුමත කරන ලද පර්යේෂණ හා අධ්‍යාපනික ආයතන, රෝහල් සහ රජයේ දෙපාර්තමේන්තු සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 10,000 දක්වා | නිදහස් | නිදහස් |
| | | සෞඛ්‍ය අමාත්‍යාංශයේ වෛද්‍ය සැපයුම් අංශය සඳහා ලීටර් 20,000 දක්වා | | |
| | | ලීටර් 10,001 සිට 20,000 දක්වා | | රු.700/ = |
| | | ලීටර් 20,000 ට වැඩි | | රු.1,100/ = |
| 2. | අවසන් නිපැයුම සුරාබදු ගෙවීමට යටත් නොවන, ඖෂධ හා කාර්මික නිෂ්පාදන සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර (මෙම උපලේඛනයේ 3 (අ) සහ 3 (ආ) හි සඳහන් සනීපාරක්ෂක නිෂ්පාදන සඳහා යොදා ගන්නා ඊතයිල් මද්‍යසාර හැර) | ලීටර් 500 දක්වා | නිදහස් | රු. 200/ = |
| | | ලීටර් 501 සිට 10,000 දක්වා | රු. 100/ = | රු. 700/ = |
| | | ලීටර් 10,001 සිට 20,000 දක්වා | රු. 150/ = | රු. 800/ = |
| | | ලීටර් 20,000 ට වැඩි | රු. 200/ = | රු. 1,200/ = |
| 3. | නිෂ්පාදනයන් සඳහා භාවිතා වන ඊතයිල් මද්‍යසාර- | | | |
| | (අ) දේශීය අලෙවිය සඳහා වන සනීපාරක්ෂක නිෂ්පාදනයන්ට යොදා ගැනීම 2020.03.30 සිට 2020.08.15 දක්වා | ලීටර් 500 දක්වා | නිදහස් | රු. 200/ = |
| | | ලීටර් 501 සිට 10,000 දක්වා | | රු. 700/ = |
| | | ලීටර් 10,001 සිට 20,000 දක්වා | | රු. 800/ = |
| | | ලීටර් 20,000 ට වැඩි | | රු. 1,200/ = |
| | (ආ) අපනයනය සඳහා වන සනීපාරක්ෂක නිෂ්පාදන | සෑම ලීටරයටම | නිදහස් | රු. 25/ = |
| 4. | අවසන් නිපැයුම සුරාබදු ගෙවීමට යටත් නොවන, අපනයන නිපැයුම් නිෂ්පාදන සඳහා යොදගන්නා නිෂ්පාදනයන් සහ අපනයන නිපැයුම් නිෂ්පාදන සඳහා හෝ යන්ත්‍රෝපකරණ සේදීම සඳහා වන නිෂ්පාදනයන් සඳහා භාවිතා කරනු ලබන ඊතයිල් මද්‍යසාර | ලීටර් 500 දක්වා | නිදහස් | නිදහස් |
| | | ලීටර් 501 සිට 10,000 දක්වා | රු. 100/ = | රු. 700/ = |
| | | ලීටර් 10,001 සිට 20,000දක්වා | රු. 150/ = | රු. 800/ = |
| | | ලීටර් 20,000 ට වැඩි | රු. 200/ = | රු. 1,200/ = |
| 5. | අශුද්ධ ඊතයිල් මද්‍යසාර ස්ප්‍රීතු (කාර්මික ස්ප්‍රීතු/ දුර්වල ස්ප්‍රීතු සඳහා) | සෑම ලීටරයකටම | රු. 75/ = | රු. 1,100/ = |
| 6. | මත්පැන් (මද්‍යසාර) නිෂ්පාදනය සඳහා යොදු ගන්නා ඊතයිල් මද්‍යසාර | සෑම ලීටරයකටම | රු. 10/ = | රු. 10/ = |

07 - 122

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.